සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

| | |
|---|---|
| ක්‍රිස්තියානි ධර්මය | I |
| கிறிஸ்தவம் | I |
| Christianity | I |

**43 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**
- ❋ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❋ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ❋ උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ❋ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා **දක්වන්න.**

**1.** 'පොත් මාතාව' යන අර්ථයෙන් ශුද්ධ බයිබලය සඳහා ලතින් භාෂාවෙන් භාවිත වන වචනය වන්නේ,
(1) වුල්ගාතා ය. (2) වල්ගේට් ය. (3) ටා බිබ්ලියා ය. (4) බිබ්ලියා ය. (5) බිබ්ලොස් ය.

**2.** සමාරියාවේ මධ්‍යම කඳුකරයේ පිහිටි වැදගත් ශුද්ධස්ථානයක් වන්නේ,
(1) කානාන් ය. (2) බෙතෙල් ය. (3) අක්කෝ ය. (4) හෙබ්‍රෝන් ය. (5) නායින් ය.

**3.** ගිවිසුම් කරඬුව මගින් ඉශ්රායෙල්වරුන්ගේ කුමක් සංකේත කරන ලද්දේ ද?
(1) ශුද්ධත්වය (2) රැකවරණය (3) ඉවසීම (4) ප්‍රීතිය (5) සෙනෙහස

**4.** එලොහිම් සම්ප්‍රදායට අනුව මෝසෙස්තුමාගේ මාමණ්ඩිය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) ජෙත්රෝ (2) හොරෙබ් (3) නෝවා (4) ආරොන් (5) ජොෂුවා

**5.** "දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලය මගින් හැඩගස්වන්නේ හා පුහුණුකරවන්නේ කිතුනුවන් මිස ගණිතඥයන් නොවේ." මෙසේ ප්‍රකාශ කළේ,
(1) ශුද්ධ බර්නාඩ්තුමා ය. (2) ශුද්ධ අන්තෝනිතුමා ය.
(3) ශුද්ධ අගොස්තීනුතුමා ය. (4) ශුද්ධ ඩේමියන්තුමා ය.
(5) ශුද්ධ බෙනඩික්ට්තුමා ය.

**6.** 'බාබෙල්' යන වචනයෙහි අර්ථය කුමක් ද?
(1) දැනුම (2) විශාරදභාවය (3) සංයෝගය (4) නිපුණතාව (5) වියවුල

**7.** චර්මඡේදනය දෙවියන් වහන්සේ කවුරුන් සමඟ ඇතිකර ගත් ගිවිසුමේ බාහිර සලකුණක් වන්නේ ද?
(1) ආදම් (2) නෝවා (3) ආබ්‍රහම් (4) ජාකොබ් (5) ඊසාක්

**8.** ආබ්‍රහම්ගේ බිරිය වූ සාරා මෙන්ම වඳ ස්ත්‍රියක්ව සිට, දේව නියමය අනුව නිවුන් දරු දෙදෙනකුගේ මව වූයේ කවු ද?
(1) රෙබෙකා (2) රාකෙල් (3) ලෙයා (4) බිල්හා (5) ශිල්පා

**9.** අම්රාන් හා ජොකෙබෙද් කාගේ දෙමාපියන් ද?
(1) ලෙවීගේ (2) මෝසෙස්ගේ (3) ආරොන්ගේ (4) ජෙත්රෝගේ (5) ජාකොබ්ගේ

**10.** පාස්කු භෝජන පිළිවෙත සිදු කිරීමේ දී අනුභව කිරීමෙන් පසු උදය වන විට එම ආහාර ඉතිරි වී තිබුණහොත් ඊට කළ යුතු වූයේ කුමක් ද?
(1) අසල්වැසි ගෙදරකට දීම (2) වළලා දැමීම (3) සතුන්ට දීම
(4) ගින්නෙන් පිළිස්සීම (5) අව්වෙහි වේලා තබා ගැනීම

**11.** අත් ඉහළට ඔසවාගෙන සිටීමට ආරොන් හා හූර් විසින් උපකාර කරන ලද්දේ කවුරුන් යාච්ඤා කරමින් සිටින විට දී ද?
(1) මෝසෙස් (2) ජාකොබ් (3) රැම්සෙස් (4) ජොෂුවා (5) නතාන්

[දෙවැනි පිටුව බලන්න.

**12.** හෙබ්‍රෙව් භාෂාවේ පූජකයා යන්නට යොදා ඇති වචනය වන්නේ,
(1) කඩොෂ් ය. (2) සෙගුල්ලාහ් ය. (3) කොහෙන් ය. (4) කෝහනීම් ය. (5) ගෝයි ය.

**13.** යෙසායා ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදයේ සිට හත්වන පරිච්ඡේදය දක්වා සඳහන් වන පහත සඳහන් සුලක්ෂණ තුන සලකා බලන්න.
- අසිරිමත් උපදේශකයාණෝ
- ප්‍රතාපවත් දෙවිතුමාණෝ
- සදාතන පියාණෝ

ඉහත ලක්ෂණ තුළින් විස්තර කරන්නේ වඩින්නට සිටින,
(1) සාම රජකෙනකු පිළිබඳව ය.
(2) දිව්‍යසිවරයකු පිළිබඳව ය.
(3) වීරවරයකු පිළිබඳව ය.
(4) උපදේශකවරයකු පිළිබඳව ය.
(5) නායකයකු පිළිබඳව ය.

**14.** මියැදුනු අතීතය අමතක කර දමා අනාගතයට මුහුණ දීමට සැම විටම සූදානම් ව සිටින ස්වාමි පුරුෂයකුගේ අසීමිත ආදරයට දෙවියන් වහන්සේගේ ආදරය සමාන කරන දිව්‍යසිවරයා වන්නේ,
(1) ආමොස් ය. (2) ජෙරමියා ය. (3) එසකියෙල් ය. (4) හොසියා ය. (5) බාරොන් ය.

**15.** පුරාණ ගිවිසුමේ පහත සඳහන් ග්‍රන්ථ සලකා බලන්න.
A - ගීතාවලිය
B - ප්‍රේම ගී
C - හිතෝපදේශය
D - වීරාවලිය
E - විලාප ගී

මේවායින් ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ වන්නේ,
(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) B, C හා D පමණි.
(4) B, D හා E පමණි. (5) C, D හා E පමණි.

**16.** ධර්මශාලා හෙවත් සිනගෝගවල දී සිදුකරන ලද්දේ,
(1) ඉගැන්වීම හා දයාවේ ක්‍රියා ය. (2) ඉගැන්වීම හා භාවනා කිරීම ය.
(3) යාච්ඤා කිරීම හා දයාවේ ක්‍රියා ය. (4) භාවනා කිරීම හා මර්දන ක්‍රියා ය.
(5) යාච්ඤා කිරීම හා මර්දන ක්‍රියා ය.

**17.** ජුදා ඉතිහාසයේ භාවිත කළ 'බසාර්' (Basar) යන පදයෙහි අර්ථය වන්නේ,
(1) අශුභ ආරංචියක් ගෙන ඒමයි. (2) කනගාටුදායක ආරංචියක් ගෙන ඒමයි.
(3) යහපත් ආරංචියක් ගෙන ඒමයි. (4) අයහපත් ආරංචියක් ගෙන ඒමයි.
(5) ජයග්‍රාහී ආරංචියක් ගෙන ඒමයි.

**18.** බොහෝ විද්වතුන්ගේ සාක්ෂිවලට අනුව ශුද්ධ වූ ජොහන්තුමාගේ ශුභාරංචිය ලියන ලද්දේ කුමන ප්‍රදේශයක දී ද?
(1) කොරින්තිය (2) ජෙරුසලම (3) සමාරිය (4) මිසරය (5) එපීසය

**19.** සිරියාවේ අන්තියෝකියට සේවය සඳහා සාවුල් කැඳවාගනු ලැබුවේ,
(1) සීලස් විසිනි. (2) තීතස් විසිනි. (3) ජාකොබ් විසිනි.
(4) තිමෝතියස් විසිනි. (5) බාර්ණබස් විසිනි.

**20.** පහත සඳහන් පුද්ගලයන් පිළිබඳව සලකන්න.
A - සීලස්
B - තිමෝතියස්
C - ලූක්
D - එරස්තස්
E - මාක්

ඔවුන් අතුරෙන් පාවුලුතුමාගේ තුන්වන ධර්මදූත චාරිකාවට එක් වූ අය පමණක් වන්නේ,
(1) A, B හා C පමණි. (2) A, B හා D පමණි. (3) A, B හා E පමණි.
(4) B, C හා D පමණි. (5) B, C හා E පමණි.

**21.** ශුද්ධ වූ මතෙව් ශුභාරංචියේ සඳහන් සභාවේ සාංඝිකත්වය හා එහි අධිකාරීත්වය පිළිබඳ දේශනයේ දී ක්‍රිස්තු අනුගාමිකයන් හඳුන්වා දී ඇත්තේ කෙසේ ද?
(1) නෑණවතුන් ලෙස (2) ශුද්ධවන්තයන් ලෙස
(3) වැඩිහිටියන් ලෙස (4) බාලයන් ලෙස
(5) විශ්වාසකයන් ලෙස

**22.** වහලකු මිල දී ගැනීමේදී ගෙවන ලද මුදල වන්නේ රිදී කාසි,
(1) 20 කි. (2) 30 කි. (3) 40 කි. (4) 50 කි. (5) 60 කි.

**23.** පාරිසරික වෙනස්වීම් සහ සොහොන් කොත්වලින් ශුද්ධවරයන් උත්ථානවීම ඉදිරිපත් කරන ශුභාරංචි ගත්කතුවරයා වන්නේ,
(1) ශුද්ධ වූ බාර්ණබස්තුමා ය. (2) ශුද්ධ වූ ලූක්තුමා ය.
(3) ශුද්ධ වූ මාක්තුමා ය. (4) ශුද්ධ වූ ජොහන්තුමා ය.
(5) ශුද්ධ වූ මතෙව්තුමා ය.

**24.** 'කවර පරිසරයක දී වත් වෙනස් නොවන' යන අර්ථය දීම සඳහා ශුද්ධ වූ පාවුලුතුමා භාවිත කරන ග්‍රීක වචනය වන්නේ,
(1) ඩූලොස් ය. (2) අගාපේ ය. (3) ලාමඃ ය. (4) ඊසා ය. (5) මාහුස් ය.

**25.** ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේදී වහලෙකුව ගණන් ගනු ලැබුවේ පුරවැසි අයිතිවාසිකම් කිසිවක් නැති,
(1) නිශ්චල දේපලක් ලෙස ය.
(2) විකුණන ලද දේපලක් ලෙස ය.
(3) චංචල දේපලක් ලෙස ය.
(4) ණයට සින්න වූ දේපලක් ලෙස ය.
(5) මිල කළ නොහැකි දේපලක් ලෙස ය.

**26.** දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර අසහාය මැදිහත්කරුවාණන් වශයෙන් ක්‍රිස්තුන් වහන්සේ ව පෙන්වා දෙන නව ගිවිසුමට අයත් ලිපිය වනුයේ,
(1) ජූද්තුමා යැවූ හසුනයි.
(2) ජාකොබ්තුමා යැවූ හසුනයි.
(3) පේදුරුතුමා යැවූ පළමු හසුනයි.
(4) හෙබ්‍රෙව්වරුන් වෙත යැවූ හසුනයි.
(5) ජොහන්තුමා යැවූ දෙවන හසුනයි.

**27.** ක්‍රිස්තුන් වහන්සේගේ තේජශ්‍රීයේ දී දකුණු පස හා වම්පස අසුන් ගැනීමට අයැදූ අවස්ථාවේ දී උන්වහන්සේගේ ඉගැන්වීම වූයේ, අප සැමගේ කැඳවීම,
(1) පූජකයින් වීම බව ය. (2) දිව්‍යසිවරුන් වීම බව ය.
(3) අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් සිටීම බව ය. (4) කුරුසිය රැගෙන යාම බව ය.
(5) සේවක රජවරුන් වීම බව ය.

**28.** මාංසය අනුභව කිරීම සඳහා යොදා ඇති 'ත්‍රෝගයින්' නමැති ග්‍රීක වචනයේ අර්ථය වනුයේ,
(1) විකා කෑමයි. (2) බෙදා ගැනීමයි. (3) ඉතිරි කිරීමයි.
(4) නාස්ති නොකිරීමයි. (5) ගෞරව කිරීමයි.

**29.** දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ජෙරුසලම් සම්ප්‍රදායෙහි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) රොටී ගෙන "ආශිර්වාදය" පැවසීමයි.
(2) "මා සිහිකිරීම පිණිස මෙය සිදු කරන්න" යනුවෙන් පැවසීමයි.
(3) "රාත්‍රි කෑමෙන් පසු" යන යෙදුම භාවිත කිරීමයි.
(4) ක්‍රිස්තුන් වහන්සේගේ "රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුම" යනුවෙන් පැවසීමයි.
(5) "මෙය ඔබ උදෙසා දෙන මාගේ ශරීරයයි." යනුවෙන් පැවසීමයි.

**30.** පිලිප්තුමා එතියෝපීය නපුංසකයාට ශුභාරංචිය දේශනා කිරීම ආරම්භ කිරීමට යොදා ගත්තේ කුමන පොතක සඳහන් ශුද්ධ ලියවිලි පාඨයක් ද?
(1) ආමොස් පොත (2) ජෙරමියා පොත (3) යෙසායා පොත
(4) හොසියා පොත (5) එසකියෙල් පොත

**31.** "අන්න ස්වර්ගය විවර වී තිබෙනවාත් මනුෂ්‍ය පුත්‍රයා දෙවියන් වහන්සේගේ දකුණු පස සිටිනවාත් මට පෙනේ" යැයි නොබියව ප්‍රකාශ කළේ,
(1) පේදුරුතුමා ය. (2) ජොහන්තුමා ය. (3) ජාකොබ්තුමා ය.
(4) ස්තේපන්තුමා ය. (5) කොර්නේලියස්තුමා ය.

**32.** අන්තියෝකියේ රදගුරු ධූරය දැරූ ඉග්නේෂස්තුමා, වන මෘගයින් ට ගොදුරු කළ අධිරාජ්‍යයා වූයේ,
(1) ට්‍රාජන් ය. (2) ඩොමීෂියන් ය. (3) නීරෝ ය.
(4) මාකස් අවුරේලියස් ය. (5) සෙප්ටිමස් සෙවරස් ය.

**33.** කිතුනු සභා මුල් යුගයේ දී කිතුනු ලේඛකයකු හා සභා පියකු වශයෙන් නම් කිරීමේදී සලකා බැලූ කරුණක් වන්නේ,
(1) ලියූ පොත් සංඛ්‍යාවයි.
(2) ශුද්ධ වූ සභාවේ අනුමැතියයි.
(3) දෙමාපියන් ද ලේඛකයින් වීමයි.
(4) විශාල පාඨක සංඛ්‍යාවක් සිටීමයි.
(5) විවිධ භාෂාවලින් පොත් ලියා තිබීමයි.

**34.** 'ඇපොලොජියා' (Apologia) යන කෘතීන් දෙක හා 'ට්‍රයිපෝ සමඟ සංවාදය' (Dialogue with Trypho) යන කෘතිය ලියන ලද්දේ කවුරුන් ද?
(1) ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා
(2) ශුද්ධ වූ අගොස්තීනුතුමා
(3) ශුද්ධ වූ ජෙරොම්තුමා
(4) ශුද්ධ වූ ජස්ටින්තුමා
(5) ශුද්ධ වූ අතනාසියුස්තුමා

**35.** මැවිල්ලේ විශිෂ්ටතම මැවිල්ල ක්‍රිස්තුන් වහන්සේ වුව ද එතුමාණන් තුළ දේවත්වයක් නොමැති බවත් එම නිසා එතුමාට දේව පුත්‍රයා යැයි කිව නොහැකි බවත් පළමු වරට උගන්වන ලද්දේ,
(1) සෙලස්ටියන් විසිනි. (2) නෙස්ටෝරියන් විසිනි. (3) එව්ටිකස් විසිනි.
(4) ඒරියස් විසිනි. (5) ප්ලේවියන් විසිනි.

**36.** ක්‍රි.ව. 381 දී කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාවක් පැවැත්වීමට ශුද්ධෝත්තම පියතුමාගෙන් අවසර ගත් අධිරාජ්‍යයා වූයේ,
(1) චාල්ස් ය. (2) ක්ලොවියස් ය. (3) තියෝඩෝසියස් ය.
(4) කොන්ස්ටන්ටයින් ය. (5) පළමුවන ඔට්ටෝ ය.

**37.** ගැලවීම සඳහා දේව වරප්‍රසාදය අනිවාර්යය වන නමුත් දේව වරප්‍රසාදය පිළිගැනීමේදී මනුෂ්‍යයා අනුග්‍රහය දැක්විය යුතු බව පෙන්වා දෙන ලද්දේ,
(1) ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවයි.
(2) එපීස මන්ත්‍රණ සභාවයි.
(3) කැල්සිඩොන් මන්ත්‍රණ සභාවයි.
(4) ජෙරුසලම් මන්ත්‍රණ සභාවයි.
(5) දෙවන ඔරෙන්ජ් මන්ත්‍රණ සභාවයි.

**38.** 'ආධ්‍යාත්මික ගීතය', (The Spiritual Canticle) 'ප්‍රේමයේ ජීවන ඇල්ල' (The Living Flame of Love) හා 'ආත්මයේ අඳුරු රාත්‍රිය' (The Dark Night of the Soul) යන කෘතීන් ලියන ලද්දේ,
(1) ශුද්ධ වූ රොබට් බෙලාවියස්තුමා විසිනි.
(2) ශුද්ධ වූ ලොයෙලා හි ඉග්නාසියුස්තුමා විසිනි.
(3) ශුද්ධ වූ අවිල්ලාහි තෙරේසාතුමිය විසිනි.
(4) ශුද්ධ වූ ජෙරොම්තුමා විසිනි.
(5) ශුද්ධ වූ කුරුසියේ ජුවාම්තුමා විසිනි.

**39.** ක්‍රි.ව. 1602 දී ශ්‍රී ලංකාවට පැමිණි ජේසු නිකායික ධර්ම දූතවරුන්ට සේවය සඳහා ලබා දුන් ප්‍රදේශය කුමක් ද?
(1) මහ ඔය දකුණ (2) මහ ඔය උතුර (3) කළු ගඟ උතුර
(4) කළු ගඟ දකුණ (5) ගිං ගඟ උතුර

**40.** ඉන්දියාවේ ගෝව නගරයෙන් අධ්‍යාපනය ලැබ, පෘතුගාලයේ කොයිම්බ්‍රා විශ්ව විද්‍යාලයෙන් දේව ධර්මය හදාරා, ලිස්බනයේ වෙල්හෙරොන් නම් ස්ථානයේ දෙව් මැදුරක් තනවන ලද්දේ,
(1) දෝන කතරිනා විසිනි.
(2) ජයවීර බණ්ඩාර විසිනි.
(3) කරලියද්දේ බණ්ඩාර විසිනි.
(4) වීර සුන්දර බණ්ඩාර විසිනි.
(5) දොන් ජුවම් යමසිංහ විසිනි.

**41.** ක්‍රි.ව. 2015 ජනවාරි 14 දින ජුසේ වාස් පියතුමාව ශුද්ධවරයට ඔසවන ලද ශුද්ධෝත්තම පියතුමා වන්නේ,
(1) පළමුවන ෆ්‍රැන්සිස් ය.
(2) පළමුවන ජුවාම් පාවුලු ය.
(3) දෙවන ජුවාම් පාවුලු ය.
(4) සයවන පාවුලු ය.
(5) විසිතුන් වන ජුවාම් ය.

**42.** සෑම දේවස්ථානයක් ආශ්‍රිතවම පැරිෂ් පාසල් ආරම්භ කර රාජ්‍ය අනුග්‍රහය ලබා එමගින් ධර්ම ප්‍රචාරක කටයුතු සංවිධානය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ගරු දොන් පීටර්
(2) ගරු ජෝශප් මේරි බ්‍රාවි
(3) ගරු පිලිප්පුස් බල්දේවුස්
(4) ගරු ජෝන් ස්ටීවන් සෙමේරියා
(5) ගරු ක්‍රිස්ටෝෆර් බොන්ජන්

**43.** සෑම වසරකම දෙසැම්බර් මස පළමු ඉරුදින ශුද්ධ වූ සභාව විසින් සමරනු ලබන්නේ,
(1) ළමා ධර්මදූත ඉරුදිනයයි.
(2) ධර්මෝපදේශ ඉරුදිනයයි.
(3) බයිබල් ඉරුදිනයයි.
(4) දේව වචනයේ ඉරුදිනයයි.
(5) ජාතික කුඩා කිතුනු සංඝ ඉරුදිනයයි.

**44.** සිල්වෙස්ත්‍රීන බෙනදිකාන නිකායෙන් ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ධර්මදූත පියතුමා කවුරුන් ද?
(1) ගරු ගොන්සාලෝ
(2) ගරු ජෝශප් මේරි බ්‍රාවි
(3) ගරු ජුවන් ද විලා කොන්දේ
(4) ගරු අන්තෝනියෝ පදාම්
(5) ගරු සීමන් ද කොයිම්බ්‍රා

**45.** ආධාර ලබන පාසල් ක්‍රමය වෙනුවෙන් සටන් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාව මෙන් ම සිංහල සහ දෙමළ භාෂා ද අධ්‍යාපන විෂය මාලාවට එක් කළ යුතු යැයි අවධාරණය කළ පියතුමා වන්නේ,
(1) ගරු බැස්ටියන් පිල්ලෙ ය.
(2) ගරු එවුජීන් ජෝන් හර්බට් ය.
(3) ගරු ෆර්ඩිනල් බොනෙල් ය.
(4) ගරු ජෝන් ස්ටීවන් සෙමේරියා ය.
(5) ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් ය.

**46.** වර්ෂ 1929 සිට 1963 දක්වා කාලය තුළ 'සදාසරණ දේවමාතාවන්ගේ පැවිදි සොහොයුරියන්' සාත්තු සේවයේ යෙදී සිටි රෝහල වූයේ,
(1) කොළඹ මහ රෝහලයි.
(2) රාගම ළය රෝහලයි.
(3) කයිට්ස් රෝහලයි.
(4) මහනුවර මහ රෝහලයි.
(5) කුරුණෑගල රෝහලයි.

**47.** මිනිසා තනිව හුදෙකලාව ජීවත්වීම නොව ස්ත්‍රිය හා පුරුෂයා ලෙස සබඳතා ගොඩනගමින් පවුලක් ලෙස ජීවත් වීම දේව අභිමතය බව ප්‍රකාශ වනුයේ,
(1) මිනිසා මැවීමේ ක්‍රියාවලියෙනි.
(2) මිසරයේ වහල් මෙහෙවරින් නිදහස් වීමෙනි.
(3) පාස්කු භෝජන පිළිවෙතිනි.
(4) කානා නුවර ප්‍රාතිහාර්ය මගිනි.
(5) අනනියස් හා සපිරා සිද්ධිය මගිනි.

**48.** මිනිසත්කම උදෙසා කාලය, ශ්‍රමය හා ධනය වැය කළ යුතු බව පැහැදිලි කරනුයේ,
(1) වපුරන්නා ගේ උපමාව මගිනි.
(2) පන් දහසකට කෑම දීම මගිනි.
(3) ළදරුවන්ට ආශිර්වාද කිරීම මගිනි.
(4) යහපත් සමරිතානුවරයාගේ උපමාව මගිනි.
(5) ගොළු බිහිරකු සුව කිරීම මගිනි.

**49.** ඇන්ග්ලිකාන, මෙතොදිස්ත, ප්‍රෙස්බිටේරියානු හා කොන්ග්‍රිගේෂනල් යන විවිධ ආගමික සම්ප්‍රදායයන්ගෙන් හෙබි සභා කීපයක එකමුතුවක ප්‍රතිඵලයක් ලෙස බිහිවූයේ,

(1) ලංකා සභාව ය.
(2) ගැලවීමේ හමුදාව ය.
(3) දකුණු ඉන්දියානු සභාව ය.
(4) ක්‍රිස්තියානි රෙපරමාදු සභාව ය.
(5) රෝමානු කතෝලික සභාව ය.

**50.** ශ්‍රී ලංකාවේ කිතුනු සභා අතුරෙන් රෝමානු **නොවන** පැරණිතම සභාව වන්නේ,

(1) ලංකා සභාවයි. (2) ඕලන්ද රෙපරමාදු සභාවයි. (3) මෙතොදිස්ත සභාවයි.
(4) බැප්ටිස්ට් සභාවයි. (5) දකුණු ඉන්දියානු සභාවයි.

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ක්‍රිස්තියානි ධර්මය II
கிறிஸ்தவம் II
Christianity II

43 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

* **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) වීර නායකයන්ගේ පාලනයේ දුර්වලතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) වීර නායකයන්ගෙන් පසුව ඉශ්‍රායලයේ පහළ වූ ප්‍රධාන රජවරුන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 04යි)

(iii) ද්විතීය නීති සම්ප්‍රදායේ භාෂා හා සාහිත්‍ය ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) ශුද්ධ බයිබලයේ අඩංගු දේව වචනය තුළින් ඔබේ ජීවිතයට මඟ පෙන්වීම් ලබාගත හැකි අවස්ථා **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08යි)

**2.** (i) ජුදෙව් ජනතාවට ගෙවීමට සිදු වූ බදු වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) ජෙරුසලමේ දේවමාලිගාව මූලික කරගෙන පවත්වන ලද ජුදා මංගල්‍ය **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) නව ගිවිසුමේ සමාජ පසුබිම තුළ කාන්තාවන්ට හිමිව තිබූ තත්ත්වය පිළිබඳ කරුණු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) කිතුනුවන් ලෙස අප පවත්වන මංගල්‍යයන් අර්ථාන්විතව පැවැත්වීමට ගත යුතු පියවර **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08යි)

**3.** (i) පළමු සියවසේ කිතුනුවන්ට පීඩා කළ අධිරාජ්‍යවරු **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02යි)

(ii) පස්වන පීඩන යුගයේදී දැකිය හැකි විශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04යි)

(iii) දසවන පීඩන සමයේදී යොදා ගත් පීඩන ක්‍රම **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

(iv) වත්මන් සමාජයෙන් ඔබේ විශ්වාසයට එල්ලවන බාධා **හතරක්** නම් කර ඒවා එකිනෙක ජය ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08යි)

## II කොටස

**4.** (i) දිවැසිවර එසකියෙල්ගේ කැඳවීම සම්බන්ධ විශේෂ ලක්ෂණ **පහ** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) පැවිදි හෝ පූජක හෝ දිවියට ඇතුළුවන පුද්ගලයන්ට තම දිවැසිවර කැඳවීම ඉටු කිරීමේදී වත්මන් සමාජය තුළ මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

[දෙවැනි පිටුව බලන්න.

**5.** (i) තම දිවැසිවර කැඳවීම භාර ගැනීමට මැළි වෙමින් මෝසෙස්තුමා දැක් වූ හේතු **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) නික්මයාම සිද්ධිය හරහා ඉශ්රායෙල් ජනතාව ලැබූ අත්දැකීම් තුළින් ඔබගේ ජීවිතයට ගත හැකි පාඩම් **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

**6.** (i) ශුද්ධ වූ මතෙව්තුමාගේ ශුභාරංචියේ ප්‍රධාන ලක්ෂණ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීම සඳහා ඔබ අන් අය සමඟ කටයුතු කරන ආකාරය කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**7.** (i) මාටින් ලූතර්තුමා පිළිබඳ කරුණු **පහක්** ඉදිරිපත් කර එතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් **පහක්** සඳහන් කරන්න. (ලකුණු 10යි)

(ii) වත්මන් යුගයේ කිතුනු ඇදහිල්ලට එල්ලවන අභියෝග **පහක්** සඳහන් කර ඒවා එකින් එකට මුහුණ දෙන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

**8.** (i) ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේදී ගන්නා ලද තීරණ **පහක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) කිතුනු සභාව සැම හා එක්ව ගමන් කරන සංගමනීය සභාවක් බවට පත් කිරීම සඳහා ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගේ දූත සේවයෙන් ගත හැකි ආදර්ශ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

***

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 43 - ක්‍රිස්තියානි ධර්මය

ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු බෙදී යාමේ සාරාංශය

01. ක්‍රිස්තියානි ධර්මය I ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02 කි)

බහුවරණ ප්‍රශ්න 50 කි.

එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 50 කි.

02. ක්‍රිස්තියානි ධර්මය II ප්‍රශ්න පත්‍රය

(කාලය පැය 03 කි. අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.)

මෙය I කොටස සහ II කොටස වශයෙන් කොටස් දෙකකි.

**I කොටසට ප්‍රශ්න 03 කි**

- ප්‍රශ්න 02 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට අනු කොටස් 04 කි.
- අනු කොටස් I ලකුණු 02
  II ලකුණු 04
  III ලකුණු 06
  IV ලකුණු 08 අනු කොටස් හතරට ලකුණු 20

**ප්‍රශ්න 02 ටම (2 x 20) ලකුණු 40 කි.**

**II කොටසට ප්‍රශ්න 05 කි**

- ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරේ.
- එක් ප්‍රශ්නයකට (i) සහ (ii) වශයෙන් කොටස් දෙකකි.
- (i) කොටසට ලකුණු 10 ක් ද,
- (ii) කොටසට ලකුණු 10 ක් ද, වශයෙන් එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි.

**ප්‍රශ්න තුනටම (3 x 20) ලකුණු 60 කි.**

03. I පත්‍රය ලකුණු - 50

II පත්‍රය ලකුණු - 100 ÷ 2

I, II පත්‍ර සඳහා - 50 + 50

**මුළු ලකුණු** - 100

# උත්තර පත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.

   ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ...................................................... <br> ...................................................... <br> ...................................................... | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ...................................................... <br> ...................................................... <br> ...................................................... | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ...................................................... <br> ...................................................... <br> ...................................................... | √ | △ $\frac{3}{5}$ |

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

| විෂයය අංකය<br>பாட இலக்கம் | 43 | විෂයය<br>பாடம் | ක්‍රිස්තියානි ධර්මය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 4 | 31. | 4 | 41. | 1 |
| 02. | 2 | 12. | 3 | 22. | 2 | 32. | 1 | 42. | 3 |
| 03. | 1 | 13. | 1 | 23. | 5 | 33. | 2 | 43. | 3 |
| 04. | 1 | 14. | 4 | 24. | 4 | 34. | 4 | 44. | 2 |
| 05. | 3 | 15. | 1 | 25. | 3 | 35. | 4 | 45. | 5 |
| 06. | 5 | 16. | 2 | 26. | 4 | 36. | 3 | 46. | 2 |
| 07. | 3 | 17. | 3 | 27. | 5 | 37. | 5 | 47. | 1 |
| 08. | 1 | 18. | 5 | 28. | 1 | 38. | 5 | 48. | 4 |
| 09. | 2 | 19. | 5 | 29. | 1 | 39. | 2 | 49. | 3 |
| 10. | 4 | 20. | 2 | 30. | 3 | 40. | 5 | 50. | 2 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - [redacted](2024)

## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය

### I කොටස

**1. (i) වීර නායකයන්ගේ පාලනයේ දුර්වලතා දෙකක් සඳහන් කරන්න.** **(ලකුණු 02යි)**

පාලනය මුළු දේශය පුරා ම පැතිර නොයාම.

ජුදා ගෝත්‍ර හැම එකක් ම එක් සේසත් කිරීමට නොහැකි වීම.

**(ii) වීර නායකයන්ගෙන් පසුව ඉශ්‍රායලයේ පහළ වූ ප්‍රධාන රජවරුන් දෙදෙනකු නම් කරන්න.** **(ලකුණු 04යි)**

සාවුල් රජතුමා

දාවිත් රජතුමා

සලමොන් රජතුමා

**(iii) ද්විතීය නීති සම්ප්‍රදායේ භාෂා හා සාහිත්‍ය ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න.** **(ලකුණු 06යි)**

අනුශාසනාත්මක වීම

මෝසෙස් තුමාගේ දේශනාවලට වැදගත් තැන් හිමි වේ. උදා: දේශනා

එකමදේ නැවත නැවත කීම මෙහි තව විශේෂ ලකෂණයකි.

***(කරුණු 03 ක් විස්තර කර තිබිය යුතුය)***

**(iv) ශුද්ධ බයිබලයේ අඩංගු දේව වචනය තුළින් ඔබේ ජීවිතයට මඟ පෙන්වීම් ලබාගත හැකි අවස්ථා හතරක් කෙටියෙන් විස්තර කරන්න.** **(ලකුණු 08යි)**

- දවසට නියමිත ශුද්ධ ලියවිලි පාඨය කියවා මෙනෙහි කිරීම තුළින් ජීවිතයට මඟපෙන්වීමක් ලබා ගත හැක. දවස ආරම්භයේ දේව වචනය මෙනෙහි කිරීම තුළින් දෙවියන් වහන්සේ අපට දෙන පණිවිඩය තේරුම් ගෙන ඊට අනුකූලව ජීවිතය හැඩගන්වා ගැනීමට අවස්ථාවක් ලබා ගත හැකිය. දෙවියන් වහන්සේට ස්තුති කිරීමට ද හැකි වේ.
- එදිනදා ජීවිතයේදී අපට පැමිණෙන අභියෝගවලට ශක්තිමත්ව මුහුණදීමට දේව වචනය පිටුබලයක් කරගැනීම.
  දෙවියන් වහන්සේගේ වචනය ශුද්ධ බයිබලය තුළ ගැබ්වී තිබෙන නිසා අපගේ සෑම ප්‍රශ්නයකටම පිළිතුරක් ලබාගැනීමට අවස්ථාවක් ලැබේ.
- සෑම සුබ කටයුත්තක්ම ආරම්භ කිරීමට පෙර ශුද්ධ බයිබලයේ කොටසක් කියවා ඒ තුළින් ආශීර්වාදය ලබාගැනීමට හැකිවේ.
- ඉරු දින දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගිවී දේව වචනයට සාවධානව ඇහුම් කන්දීම තුළින් මඟපෙන්වීමක් ලබා ගැනීම.

- කතෝලිකයන්ගේ උතුම්ම වන්දනාව වන දිව්‍ය පූජාව තුළ කියවෙන දේව වචනය තුළින් එම සතියට අවශ්‍ය වරප්‍රසාද ලබාගැනීමට අවස්ථාවක් කරගැනීම දේශනයේ සුබාරංචි පණිවිඩය අනුව ජීවත්වීමට අවස්ථාවක් ලැබීම.
- බරපතල ලෙස අසනීප වූ අවස්ථාවලදී ඉක්මන් සුවය පතා ශුද්ධ බයිබලයෙන් කොටසක් කියවා මෙනෙහි කිරීම. ජේසුස් වහන්සේ ලෙඩුන් සුව කළ අවස්ථා සිහිකර ගනිමින් විශ්වාසය ඇතිකර ගැනීම.

***(මෙවැනි කරුණු 04ක් විස්තර කර තිබිය යුතුය)***

**2. (i) ජුදෙව් ජනතාවට ගෙවීමට සිදු වූ බදු වර්ග දෙක නම් කරන්න.** **(ලකුණු 02යි)**

රෝම අධිරාජයාට ගෙවිය යුතු බද්ද
දේව මාලිගා බද්ද

**(ii) ජෙරුසලමේ දේවමාලිගාව මූලික කරගෙන පවත්වන ලද ජුදා මංගල්‍ය දෙකක් සඳහන් කරන්න.** **(ලකුණු 04යි)**

ජුදා පාස්කුව සැමරීම
කූඩාරම් මංගල්‍යය
පෙන්තකොස්ත මංගල්‍යය

**(iii) නව ගිවිසුමේ සමාජ පසුබිම තුළ කාන්තාවන්ට හිමිව තිබූ තත්ත්වය පිළිබඳ කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න.** **(ලකුණු 06යි)**

- පුරුෂාධිපත්‍යය පැවති ජුදෙව් සමාජය තුළ කාන්තාවන්ට නිසි සමාජ අයිතිවාසිකම් නොමැති වීය.
- මොවුන් පුරුෂාධිපත්‍යයට යටත් වූ අතර අධ්‍යාපන හා රැකියා අවස්ථා ද අහිමි වූ පිරිසක් වූහ.
- ආගමික වශයෙන් ද එතරම් සැලකිල්ලක් නොලැබිණ.
- මොවුන්ට පිරිමි හා සම අයිතිවාසිකම් නොලැබිණ.
- යම් අයුරකින් කාන්තාවෝ වැන්දඹුවන් වූ කළ ඉතා අන්ත අසරණ තත්වයට පත්වූහ.

**(iv) කිතුනුවන් ලෙස අප පවත්වන මංගල්‍යයන් අර්ථාන්විතව පැවැත්වීමට ගත යුතු පියවර හතරක් කෙටියෙන් විස්තර කරන්න.** **(ලකුණු 08යි)**

- කොඩිගස එසවූ දින පටන් සෑම නුවාන පූජාවකටම සහභාගී වී, ශුද්ධ වූ ජපමාලය, සාන්තුවර ප්‍රාර්ථනාව සහ දිව්‍ය පූජාවේ දේශනයෙන් අප ජීවිත අර්ථාන්විත කරගැනීමට පූර්ණ කැපකිරීමකින් කටයුතු කිරීම.
- මංගල්‍යය කටයුතුවලට සමාගාමීව සිදුවන බාහිර ක්‍රියාකාරකම් ද නොපිරිහෙලා ඉටුකිරීම සහ ඒවාට සම්බන්ධවීම.
- දේවස්ථාන නුවාන මංගල්‍යය සමය තුළ අනවශ්‍ය විනෝදකාමිත්වයෙන් වැළකීම. එම කාල පරිච්ඡේදය වරප්‍රසාදීය කාල පරිච්ඡේදයක් ලෙස ගතකිරීම.
- මංගල්‍යයේ බාහිර ආඩම්බර විය හියදම්වලට නව අර්ථයක් දෙමින් මීසමේ අසරණ, දුගී පවුලකට නිවසක් නොමැති නම් නිවසක් සාදා පරිත්‍යාග කිරීම.

- මංගල්‍යය නුවාන සමය තුළ නිකායික පූජාප්‍රසාදීන් වහන්සේලාගේ මෙහෙයවීමෙන් සෑම කෙනෙකුම සහභාගි කරවාගෙන ධර්ම විවේකයක් පැවැත්වීම.
- මංගල්‍යයන් කෑම බීමවලින් නිම නොවන්නට වගබලාගැනීම. මංගල්‍යයන් අවමංගල්‍යවලින් නිමාවෙන හෝ අඩ දබර, භේද භින්නවවීම්, මීසම්වාසීන්ගේ සිත් රිදවාගැනීම්වලින් තොරව සිදුකිරීම.
- යහපත් පාපොච්චාරණයක් කර අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කර ගැනීම.
  (මෙවැනි කරුණු 04 ක් විස්තර කර තිබිය යුතුය)

**3. (i) පළමු සියවසේ කිතුනුවන්ට පීඩා කළ අධිරාජ්‍යවරු දෙදෙනකු නම් කරන්න.** (ලකුණු 02යි)

නීරෝ අධිරාජ්‍යය,
ඩොමීෂියන් අධිරාජ්‍යයා, ට්‍රාජන් අධිරාජ්‍යා

**(ii) පස්වන පීඩන යුගයේදී දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.** (ලකුණු 04යි)

- මෙම අධිරාජ්‍යය විසින් ක්‍රිස්තු ධර්මය වැළඳ ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් කරන ලදී.
- රජය විසින් කිතුනුවන් සොයා ගොස් දඬුවම් දීම සිදුවිය.
- සමූහ වශයෙන් කිතුනුවන් මරා දැමීමට උත්සුක වූ සමයකි.
- අති දරුණු ප්‍රහාරවලට ලක්වීමට කිතුනුවන්ට සිදුවිය. මෙකල ශු අයිරේනියස් තුමා, ශු. පර්පෙචුවාතුමිය වැනි අය ප්‍රාණ පරිත්‍යාගී වූහ.
- පීඩා මැද වර්ධනය වූ කිතු දහමේ ආලෝකය අධිරාජ්‍යයේ දසත පැතිරෙන්නට විය.

**(iii) දසවන පීඩන සමයේදී යොදා ගත් පීඩන ක්‍රම තුනක් කෙටියෙන් විස්තර කරන්න.** (ලකුණු 06යි)

- ශුද්ධ ලියවිලි හා දෙව්මැඳුරු පුළුස්සා දැමීම.
- කිතුනුවන්ට රෝම දෙවි දේවතාවන් පිදීමට බල කිරීම.
- කිතුනුවන් රාජ්‍ය සේවයෙන් පහ කිරීම
- කිතුනුවන් වහලුන් නිදහස් කිරීමට එරෙහිව නීති පැනවීම.
- ප්‍රසිද්ධියේ කිතුදහම අත්හරින බවට පොරොන්දුවීමට සිදුවීම.
- ප්‍රාණපරිත්‍යාගීන්ගේ සොහොන් කොත් වනසා දැමීම.
- කිතුනුව කැබලි කොට මරාදැමීම.
- ගස්වල හා කණුවල බැඳ පිලිස්සීම
- බරපතල වැඩසහිත සිරගත කිරීම.
- රටින් පිටුවහල් කිරීම.
- දරුණු වන මෘගයන් මැදට විසිකිරීම.

- හිස ගසා දැමීම.
- රත්වූ යකඩ පුටුවල බැඳ පිලිස්සීම.
- ඇස් උගුළුවා දැමීම.
- කුසගින්නේ තබා මැරෙන්නට ඉඩහැරීම.
- ශරීරය ඉරා දෙපළු කිරීම.

**(iv) වත්මන් සමාජයෙන් ඔබේ විශ්වාසයට එල්ලවන බාධා හතරක් නම් කර ඒවා එකිනෙක ජය ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න.** (ලකුණු 08යි)

ඇති බාධා:

- සමාජය විසින් කොන් කරනු ලැබීම.
- ජීවිතයේ ඇතිවන අභියෝග.
- නිදහස් ලිංගික හැසිරීමට ඇති පෙළඹීම.
- වෙනත් ආගමිකයින් හා ඇසුර.
- පවුල් පරිසරයෙන් ඇති බලපෑම්.
- විශ්වාසය හා තම අනන්‍යතාවය නිසා ඇතිවන ගැටුම්.
- තම විශ්වාසය නිසා අපහාසයට මුහුණ දීම.

(මෙවැනි කරුණු හතරක් ලියා ඇත්නම් ලකුණු හතරක් දෙන්න. ඒවා ජය ගන්නා ආකාරය කෙටියෙන් සාකච්ඡා කර ඇති නම් ලකුණු හතරක් දෙන්න. මුළු ලකුණු අටයි)

**4. ඉගෙනුම් අභිමතාර්ථය:** ඉශ්‍රායෙල් දිවැසිවර භූමිකාව අධ්‍යයනය කරමින් වත්මන් සමාජයේ තම දිවැසිවර වගකීම අවබෝධ කර ගනී.

## II කොටස

**4. (i) දිවැසිවර එසකියෙල්ගේ කැඳවීම සම්බන්ධ විශේෂ ලක්ෂණ පහ කෙටියෙන් පැහැදිලි කරන්න.** (ලකුණු 10යි)

1. දේව දර්ශනය හෝ විශේෂ අත්දැකීම
   දිවැසිවරයා ඉතා සංකීරණ දර්ශනයක් දකියි දෙවියන් වහන්සේගේ අභිරහස් වැඩසිටීම එයින් සංකේතවත් කරයි..
2. දූත මෙහෙවර පැවරීම, එසකියෙල් තුළට දේවානුභාවය ඇතුළුවීම මඟින් සංක්තවත් කරනුයේ දූත මෙහෙවර දියත් කිරීමට දිවැසිවරයා ලබන බලයයි.
3. කැඳවීම භාර ගැනීමට දිවැසිවරයා මැළිවෙයි.
   දිවැසිවරයාට පැවරී ඇත්තේ විප්‍රවාසීව සිටින දැඩි සිත් ඇති සිය ජනතාවට දේශනා කිරීමටය. මුරණ්ඩු ජනතාවකට මුහුණ දීමට දිවැසිවරයා අකමැති වෙයි. දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයා ධෛර්යවත් කරනු ලබයි.

4. දෙවියන් වහන්සේගේ හස්තයේ ඇති අකුළන පොතක් අනුභව කිරීම සඳහා දිවැසිවරයාට දෙනු ලබයි. සාමාන්‍යයෙන් හකුළන ලද ලියවිල්ලක් ලියා තිබුනේ ඇතුළත පමණි. දෙපැත්තේම ලියා ඇති මෙම අස්වාභාවික ලියවිල්ලෙන් අදහස් කරන්නේ එය දේව අනාවරණයන්ගෙන් පිරීඇති බවයි

5. දිවැසිවරයා යවනු ලැබීම
ඉතා මුරණ්ඩු තද සිත් ඇති කැරලිකාර වංශයක් වන විප්‍රවාසගත ජනතාවගේ මුරණ්ඩු සිත් වෙනුවට මාංශමය හදවතක් ඇතිකිරීමට එසකියල් යවනු ලබයිඔහුයවනු ලබන්නේ දෙවියන් වහන්සේට විරුද්ධව කැරලි ගැසූ ජනතාවක් වෙතටය. ඔහුගේ සුවිශේෂකාරයය නම් දේව පණිවිඩය ජනතාවට පොදුවේ ත බෙදාදීමයි.

**(ii) පැවිදි හෝ පූජක හෝ දිවියට ඇතුළුවන පුද්ගලයන්ට තම දිවැසිවර කැඳවීම ඉටු කිරීමේදී වත්මන් සමාජය තුළ මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග පහක් විස්තර කරන්න.** (ලකුණු 10යි)

- <u>ප්‍රතික්ෂේප වීම</u>
  ක්‍රිස්තුන් වහන්සේ මෙන් සමාජය තුළ සිදුවන අසාධාරණකම් හමුවේ සත්‍යට සාක්ෂි දැරීමේදී ප්‍රතික්ෂේප වීම්වලට ලක්වීම.
- <u>බහු ආගමික හා බහු සංස්කෘතික ඇති සමාජයක කටයුතු කිරීමේදී එල්ලවන බලපෑම්</u>
  එනම් විවිධ වූ ආගම්වලින් පිරී ඇති සමාජයක ඒක දේව විශ්වාසය තුළ ක්‍රියා කිරීමේදී හමුවන අභියෝගවලට මුහුණ දීමට සිදුවීම.
- <u>මූල ධර්මවාදීන්ගෙන් එල්ල වන බලපෑම.</u>
  ඒක දේවවාදය තුළ කටයුතු කිරීමේ දී මූල ධර්මවාදීන් සිදුකරන බලපෑම උදාසීන ගිහි ජනතාව මූල ධර්මවාදීන්ගේ වින්දිතයින් වීමේ ප්‍රබල අභියෝගය
- <u>ලෞකිකත්වයට නැඹුරු වීම.</u>
  තම ආධ්‍යාත්මික ජීවිතයට තිබෙන නැඹුරු වීම හා ඇති ලැදියාව පහවයමින් ධනය බලය කීර්තිය ලබාගැනීමට ඇති ආශාවන්වලට පෙළඹවීම තුළ කටයුතු කිරීමට දක්වන්නාවූ කැමැත්ත
- <u>මානසික පීඩනය ඇතිවීම.</u>
  තමාට ඇති වගකීම් සිදුකිරීමේ දී ඇති වන කර්යය බහුලත්වය නිසා තමාට ඇතිවන, ඇති කරවන බලපෑම්
- කාලය හා ශ්‍රමය කැපකිරීමට ඇති බලකිරීම් නිසා ඇතිවන පීඩාකාරී තත්වය හේතුවෙන් මානසික රෝගී තත්වයට යොමුවීම.

## 05. ඉගෙනුම් අභිමතාර්ථය: ඉශ්රායෙල් ගමන තුළ ලැබූ දිව්‍ය සංරක්ෂණය කිතුණු දිවිය තුළ අත්දකියි.

5. (i) තම දිවැසිවර කැඳවීම භාර ගැනීමට මැළි වෙමින් මෝසෙස්තුමා දැක් වූ හේතු **පහක්** විස්තර කරන්න.(ලකුණු 10යි)

- පාරාවෝ වෙත යාමටත් ඉශ්රායෙල් ජනයා මිසරයෙන් පිටතට ගෙන යාමට මම කවරෙක්ද යි ඇසීය.
- ඔවුන් උන්වහන්සේගේ නම කුමක් දැයි මාගෙන් අසන කල මම ඔවුන්ට කුමක් කියම්දැයි ඇසීය..
- ඔවුන් මා විශ්වාස නොකොට මාගේ හඬට සවන් නොදී සමිඳාණන් වහන්සේ ඔබට දර්ශනය නොවූ සේකැයි කීවොත් කුමක් කරන්නේ දැයි ඇසීය.
- "....... මම ව්‍යක්ත කථිකයෙක් නොවෙමි. කීමෙහි බිණීමෙහි දුබලය. දිව ගොත ගහන සුලුය." කීය..
- "අනේ මගේ ස්වාමිනි කරුණාකර ඔබ කැමති අන් කෙනෙකු යැව්ව මැනව" යි කීය.

(ii) නික්මයාම සිද්ධිය හරහා ඉශ්රායෙල් ජනතාව ලැබූ අත්දැකීම් තුළින් ඔබගේ ජීවිතයට ගත හැකි පාඩම් **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

- <u>සෑම අභියෝගයක් හමුවේම දිව්‍ය සංරක්ෂණය කෙරෙහි විශ්වාසය තැබීම</u>
  ඉශ්රායෙල් ජනතාව වහල් බවින් මිදී පොරොන්දු දේශය කරා යන ගමන අතරතුර දිව්‍ය සංරක්ෂණය විවිධ ආකාරයෙන් අත්දැක්කාක් මෙන් අප ජීවිත වෙත පැමිණෙන අභියෝග හමුවේ දිව්‍ය රක්ෂණය අත්දකිමින් ඒ තුළ විශ්වාසය තබමින් අභියෝග ජයගැනීමට හැකිවන බව පෙන්වා දෙයි.
- <u>ජීවිතයේ අධෛර්යවීම් හා අසරණවීම් තුළ මැසිවිලි සහ අවලාද නොපැවසීම.</u>
  පාළුකරයේ දී අධෛර්යමත් සහ අසරණව සිටි ඉශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේට සහ මෝසෙස්තුමාට විරුද්ධව අවලාද කී නිසා, විෂකුරු සර්පයන්ට ගොදුරුවීමට සිදුවිය. ඒ තුළින් අපට පෙන්වන්නේ අප ජීවිතයේ අධෛර්යවීම් සහ අසරණවීම් තුළදීද දෙවියන් වහන්සේට මැසිවිලි සහ අවලාද නොපැවසිය යුතු බවයි. විශ්වාසය තුළ ජීවත් විය යුතු බවයි.
- <u>යාච්ඤාව තුළ දේව ආදරය අත්දැකීම</u>
  නික්මයාම ගමනේ ඉශ්රායෙල් ජනයා සහ අමලෙක්වරු අතර පැවති සටනේදී මෝසෙස්තුමා දෑත් ඔසවාගෙන යාච්ඤා කිරීම තුළින් අපට පෙන්වන්නේ අපගේ එදිනෙදා යාච්ඤාව තුළ දේව ආදරය අත්දැකීමට හැකිවන බවයි. ජීවිතයට යාච්ඤාව අත්‍යාවශ්‍ය බවයි.
- <u>සැබෑ සිත් හැරීම තුළ දිව්‍ය සංරක්ෂණයට නතුවීම</u>
  අප අපගේ පාපී බව පිළිගෙන ඒ තුළ සැබෑ සිත්හැරීමක් ඇතිකරගෙන පාපවලට සැබෑ ලෙස මනස්ථාපනයවී සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබාගැනීම තුළින් නැවත දිව්‍ය සංරක්ෂණයට නතුවීමට හැකිවෙයි.
- <u>අප එකිනෙකා පිළිබඳව දෙවියන් වහන්සේට සැලැස්මක් ඇති බව විශ්වාස කිරීම</u>

ඉශ්රායෙල් ජනයාව දෙවියන් වහන්සේ පොරොන්දු දේශය කරා ගෙනගියාක් මෙන් අපගේ ද අවශ්‍යතා දැනගෙන උන් වහන්සේගේ සැලැස්ම තුළ අපව ශක්තිමත් කරමින් දේව සැලැස්ම විශ්වාස කිරීම.

**6. ඉගෙනුම් අභිමතාර්ථය:** දේව රාජ්‍යයේ වටිනාකම් අවබෝධ කර ගනිමින් මේ මිහිමත ජීවා සැබෑවක් කරන්නට තිබෙන වගකීම අවබෝධ කරගනියි.

**6. (i) ශුද්ධ වූ මතෙව්තුමාගේ සුභාරංචියේ ප්‍රධාන ලක්ෂණ පහක් විස්තර කරන්න.** (ලකුණු 10යි)

- ශුද්ධ වූ මතෙව් තුමාගේ අරමුණ වන්නේ යුගයෙන් යුගයට යුදෙව් ජනතාව බලාපොරොත්තුවෙන් සිටි විමුක්තිදායකයාණන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ බව පෙන්වා දීමය.
- තවද ජේසුස් වහන්සේව ඉදිරිපත් කරන්නේ නව මෝසෙස් මෙන් ම බලාපොරොත්තුවෙන් සිටි මෙසියානික ගුරුතුමාණන් ලෙස ය. මේ හේතුව නිසා මෙතුමා ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම ප්‍රධාන දේශනා පහකට (පැරණි ගිවිසුමේ පංච පුස්තකය මෙන්) ගොනු කර ඇත.
- මෝසෙස්තුමා සීනයි කන්දේදී දුන් ව්‍යවස්ථාවේ මැදිහත්කරුවා වූවා සේ, ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනාවේ දී අලුත් ව්‍යවස්ථාවක් ස්ථාපිත කළහ. (මතෙව් 5:1) මෝසෙස්තුමාගේ පනත් දහය මෙන් ක්‍රිස්තුන් වහන්සේ ද ප්‍රතිපත්ති අටක් ලබා දෙයි. (මතෙව් 5:3- 10)
- ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීමේ කාර්යයට අනෙකුත් සිද්ධීන් වලට වඩා වැඩි තැනක් දෙන මතෙව්තුමා ක්‍රිස්තුන් වහන්සේගේ විවිධ ඉගැන්වීම් ඒකරාශි කොට ක්‍රමානුකූල ව දක්වයි.
- තව ද ජේසුස් වහන්සේ නව ව්‍යවස්ථාදායකයාණන් හා ඇදුරුතුමා ලෙස ව්‍යවස්ථාව හා දිවැසාවලිය සම්පූර්ණ කරන බව ද දක්වයි. (මතෙව් 5:17) මතෙව්තුමා දේශනා 05 ක් ඉදිරිපත් කර ඇත.

**(ii) දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීම සඳහා ඔබ අන් අය සමඟ කටයුතු කරන ආකාරය කරුණු පහකින් පැහැදිලි කරන්න.** (ලකුණු 10යි)

- බොදුනු දරුවන් අතර සමාජිකයෙකු නම් මා ඔවුන්ට පවසනුයේ ක්‍රිස්තුන් වහන්සේ ඉදිරිපත් කළ භාග්‍යය 08 දේව රාජ්‍යය උරුම කරගත හැකි ආර්ය අෂ්ඨාංගික මාර්ගයක් වශයෙන් ද හඳුන්වාදීමට කටයුතු කරමි.
- ලෝකයේ සෑම මනුෂ්‍යයෙකුගේම අරමුණ භාග්‍යවන්තයෙකුවීම නිසා එයට ළඟාවීමට සරල ජීවිතයක් අවශ්‍ය බව.
- යහපත් ගති පැවතුම් ඇතිව ජීවත්වන විට සමාජයේ සෙසු අයගේ ප්‍රතික්ෂේපයට ලක් විය හැකි බව දැනගැනීම.

- දේව රාජ්‍යයේ වටිනාකම් වන සාමය, සමගිය, දයාව දැක්වීම, අන් අයව පිළිගැනීම, සතුරන්ට පවා ප්‍රේමකිරීම, සාධාරණව ජීවත්වීම, නිහතමානීකම, බැහැපත්කම, වැනි ගුණාංග ප්‍රගුණ කළ යුතු බව වටහාදීම, සහ මම ද ඒ ආකාරයෙන් ක්‍රියාකර ආදර්ශයක් වීම.
- මෙම ගුණාංග ඇතිව ජීවත්වීමට අපට සතුට, ප්‍රීතිය, සොම්නස, වාසනාව, ගෙනත් දෙන බවත්, යම් වේදනාවක්, පීඩාවක් මධ්‍යයේ වුවත් දෙවියන් වහන්සේ අත්නොහරින බව.
- මනුෂ්‍ය ලෝකයේ රාජ්‍යයන්වල ප්‍රතිපත්ති, ප්‍රඥප්ති, ව්‍යවස්ථා, කිතුනුවන් ලෙස අපව දේව රාජ්‍යයේ ප්‍රතිපත්තිවලට ළංකළ යුතු නිසා ඒ වෙනුවෙන් වෙර දැරීම.

(මෙවැනි කරුණු පහක් ලියා පැහැදිලි ඇත්නම් ලකුණු පිරිනමන්න.)

**07. ඉගෙනුම් අභිමතාර්ථය:** වත්මන් යුගයේ කිතුනු ඇදහිල්ලට එල්ල වන අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කර ගනියි.

**7. (i) මාටින් ලූතර්තුමා පිළිබඳ කරුණු පහක් ඉදිරිපත් කර එතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් පහක් සඳහන් කරන්න.** **(ලකුණු 10යි)**

- ඔහු අගොස්තීනු නිකායේ පූජකවරයෙකි.
- ඔහු විටෙන්බර්ග් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකි.
- ශුද්ධ වූ සභාවේ සිදුවෙමින් තිබූ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව කලකිරීමට පත්විය
- ශුද්ධ වූ පේදුරුතුමාගේ බැසිලිකාව ගොඩනැගීමට අවශ්‍ය මුදල් සපයා ගැනීමට පාප්තුමා කළ පූර්ණඵල වෙළඳාමට විරුද්ධ විය
- පූර්ණඵල වෙළඳාම ඇතුළු කරුණු 95 කට විරෝධය දක්වා 1517. 10. 31 විටන්බර්ග් දෙව්මැදුරේ චෝදනා පත්‍රයක් ප්‍රදර්ශනය කළේය.
- ලූතර්තුමාට තම චෝදනා ඉල්ලා අස්කර ගැනීමට දින 60ක කාලයක් ලබාදෙන ලදී
- එම චෝදනා ඉල්ලා අස්කර නොගත් නිසා 1521 දී ඔහු ශුද්ධ වූ සභාවෙන් නෙරපාදමන ලදී
- ඔහු ලුතරාන සභාව පිහිටුවන ලදී.
- කිතුනුවන්ට විමුක්තිය අත්වන්නේ ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි දක්වන ඇදහිල්ලෙන් පමණි
- ක්‍රිස්තුවහන්සේ විසින්ම ස්ථාපිථ කරන ලද ප්‍රසාදය නිධාන දෙකකි (ප්‍රසාද ස්තාපනය හා දිව්‍ය සත් ප්‍රසාදය)
- කිතු සසුන සියලු ඇදහිලිවතුන්ගේ සහභාගිත්වයෙන්
- ක්‍රිස්තුන් වහන්දේ හැර කිසිවකුට වහල් නොවිය යුතුය
- කිතුනු ජීවිතයේ කේන්ද්‍රස්ථානය දිව්‍යමය ඉගැන්වීම් සහිත ශුද්ධ බයිබලයයි.
- ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම පූජකවරය සඳහා කැඳවීම ලැබිය හැකි අතර, දේවගැතිවරුන් විවාහ වීමේ අයිතය ඇත.

(මෙවැනි කරුණු හෝ ඔහුගේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳ කරුණු ද ලියා ඇත්නම් ලකුණු ලබා දිය හැකිය.)

**(ii) වත්මන් යුගයේ කිතුනු ඇදහිල්ලට එල්ලවන අභියෝග පහක් සඳහන් කර ඒවා එකින් එකට මුහුණ දෙන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.** (ලකුණු 10යි)

- <u>මූලධර්මවාදීන් විසින් අපගේ සත්‍ය විශ්වාසයට පටහැනි කරුණු ඉදිරිපත් කිරීම තුළින් ඒක දේව විශ්වාසයට බාධා එල්ලවීම.</u>
  එවැනි අවස්ථාවලදී තමන් දෙවිඳුන් තුළ ලැබූ අත්දැකීම් මත යැපෙමින් තම විශ්වාසයේ ස්ථිරව සිටිමින් තම විශ්වාසයට එල්ලවන අභියෝග ජයගැනීම.
- <u>දෙවියන් වහන්සේගෙන් අයදින දේ නොලැබුන අවස්ථාවලදී වෙනත් බලවේගයන්ට යොමුවීම.</u>
  උදා: වෙනත් ආගම් ඔස්සේ යාම, සාස්තර බැලීම. දෙවියන් වහන්සේගේ සැලැස්ම පිළිබඳ විශ්වාසය තබමින් උන් වහන්සේ තමන්ට කිසිදු වරදක්වීමට ඉඩ නොතබන බව විශ්වාස කරමින් තම විශ්වාසයට එල්ල වන අභියෝග ජය ගත හැක.
- ශුද්ධ වූ සභාවේ විවිධ නායක, නායිකාවන්ගේ ක්‍රියාකලාපයන් සහ ඔවුන්ගේ අඩුපාඩු හේතුකොටගෙන තම විශ්වාසයට බාධා එල්ලවීම
  මෙවැනි අවස්ථාවන්හිදී ශුද්ධ සභාව විවේචනය කරනවා වෙනුවට සභා නායකයන් වෙනුවෙන් යාච්ඤා කරමින් තම විශ්වාසයට එල්ලවන බාධා ජයගත හැකිය.
- ඉරුදින (සබත් දින) උපකාරක පන්ති පැවැත්වීම හේතුවෙන් දහම් පාසල් යාමට නොහැකිවීම. මේ හේතුව නිසා ආධ්‍යාත්මිකත්වය වර්ධනය කරගනිමින් විශ්වාසයට සාක්ෂි දැරීමට අද තරුණ, තරුණියන් දක්වන අකැමැත්ත.
- දිව්‍ය පූජාවේ සැබෑ වටිනාකම් තේරුම්ගෙන දෙවිඳුන් තුළ යැපෙමින් තම ජීවිත අභියෝග ජයගැනීමට දහම් පාසලෙන් වන උපකාරය ද සිහියට ගැනීම. දිව්‍ය පූජාවේදදී ලැබෙන දේව වරප්‍රසාදය තුළින් පැමිණෙන අභියෝග ජයගැනීමට හැකිවේ.
- අන්තර් ජාලය ඔස්සේ දේව විශ්වාසය පළුදුවන අකාරයේ නොයෙකුත් වැඩ සටහන් ක්‍රියාත්මකවීම
  නවීන තාක්ෂණයට දෙස්තැබීමට අපට කළ හැකි වුවත්, එය නැවැත්වීම කළ නොහැකිය. තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳව මෙයට වඩා කල්පනාකාරීවීමට කටයුතු කිරීම.
- කිතුනුවන් මිත්‍යා විශ්වාස මත යැපීම සහ ඒවා පසුපස යාම.
- දස පනතට අනුව තම ජීවිතය හැඩගස්වා ගැනීම තුළ පැමිණෙන බාධා ජයගත හැකි බව.

**ඉගෙනුම් අභිමතාර්ථය:** සභාව කාලානුරූප කර ගැනීමට ශුද්ධ වූ ජුසේ වාස් පිය ආදර්ශය නවෝදයේ ගමනට යොදා ගනියි.

**8. (i) ත්‍රිදෙන්තිනු මන්ත්‍රණ සභාවේදී ගන්නා ලද තීරණ පහක් කෙටියෙන් විස්තර කරන්න.** (ලකුණු 10යි)

- ශුද්ධ වූ බයිබලය හා ජීවන සභා සම්ප්‍රදාය යන දෙක ම ධාර්මික සත්‍යතාවන්හි උල්පත වන බව.
- දේව ප්‍රසාද නිධාන හතම ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරනු ලැබූ බව.
- ශුද්ධ වූ ජෙරොම්තුමා විසින් සම්පාදිත ශුද්ධ බයිබලයේ වල්ගේට් පිටපතට සභාවේ අනුමැතිය ලැබීම.
- පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ ග්‍රන්ථ සියල්ලම දේවානුභාවයෙන් ලියන ලද ඒවා බව. ශුද්ධ ලියවිලි පාඨ දෙවියන් වහන්සේ වෙතින් නික්මුණු නිසා ඒවායේ අර්ථය ගෙනහැර දැක්වීමේ බලය ශුද්ධ වූ සභාවේ ඉගැන්වීමේ අධිකාරියට පමණක් ඇති බව. -
- දේශනා කිරීමේ බලය හා ඉගැන්වීමේ බලය ශුද්ධ වූ සභාවට දෙවියන් වහන්සේ විසින් දානය කරනු ලැබූ බව.
- ශුද්ධ වූ පේදුරුතුමා ද එතුමාට පසුව අඛණ්ඩව පැමිණෙන ශුද්ධෝත්තම පියවරු ද ශුද්ධ වූ සභාවේ නායකත්වය දරති. විශ්වාසය හා සදාචාරය පිළිබඳව ඉගැන්වීමේ දී ශුද්ධෝත්තම පියතුමා නොවරදින සුළු භාවයෙන් යුතු වේ.
- දිව්‍ය යාගය, කල්වාරි යාගය, නිරය, ශුද්ධවර බැතිය, ශුද්ධ වූ ප්‍රතිමා තැබීම හා පූර්ණ එල ආදිය ශුද්ධ වූ සභාව විසින් පිළිගනු ලැබීම.
- විවාහය සක්‍රමේන්තුවක් ලෙස පිළිගැනීම.
- විවාහ බන්ධනය අඛණ්ඩ බව පිළිගැනීම.
- ගැලවීමේ ක්‍රියාවලියේ දී දෙවියන් වහන්සේ සමග මිනිසා ද සහයෝගය දැක්විය යුතු බව.

**(ii) කිතුනු සභාව සැම හා එක්ව ගමන් කරන සංගමනීය සභාවක් බවට පත් කිරීම සඳහා ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගේ දූත සේවයෙන් ගත හැකි ආදර්ශ පහක් විස්තර කරන්න.** (ලකුණු 10යි)

- ගිහි නායකයින් හඳුන්වා දීම
- දේශීය භාෂාවන් ඉගෙනගෙන ඒ අනුව ජනයා සමග සන්නිවේදනය කිරීම
- දේශීය පොතපත් සම්පාදනය කිරීම
- ජන වන්දනාව දේශීයකරණය කිරීම
- කිතුනු සංඝ ගොඩ නැගීම
- තනතුරු ප්‍රතික්ෂේප කිරීම සහ සේවක නායකත්වය
- නැති වූ බැටවන් සොයා යාම
(මෙවැනි කරුණු 05 ක් විස්තර කර තිබිය යුතුය)